ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

## පුවත්පත් නිවේදනය

## <u>ඉන්දියානු නාවික හමුදාවේ **ඓරාවත් නෞකාව කොළඹට** පැමිණේ</u>

ඉන්දියානු නාවික හමුදාවේ ශර්දූල් පන්තියේ ගොඩබෑමේ නෞකාවක් වන ඓරාවත් නෞකාව 2026 ජූනි 01-04 දක්වා කොළඹ සංචාරයක නිරත වීමට නියමිතය. නෞකාව මෙහෙයුම් කටයුතු සඳහා අවශ්‍ය ඉන්ධන සහ අනෙකුත් සැපයුම් ලබා ගනිමින් සුහද සංචාරයක නිරත වනු ඇත.

2. එසේම, මෙම නෞකාව ඉන්දියානු රජයේ ප්‍රදානයක් යටතේ ශ්‍රී ලංකා වෙරළාරක්ෂක බලකායේ සුරක්ෂා නෞකාව සඳහා අත්‍යවශ්‍ය අමතර කොටස් තොගයක් ද රැගෙන එනු ඇත.

3. නෞකාව ඉන්දියාවේ රැඳී සිටින කාල සීමාව තුළ, නෞකාවේ අණදෙන නිලධාරි කොමාන්ඩර් අයි. පී. පටිල් මහතා බටහිර නාවික ප්‍රදේශය භාර අණදෙන නිලධාරිතුමා හමු වනු ඇති අතර නෞකාවේ කාර්ය මණ්ඩලය ශ්‍රී ලංකා නාවික හමුදාව සමඟ වෘත්තීය සහ ක්‍රීඩා කටයුතුවල නිරත වනු ඇත. තවද, නෞකාවේ කාර්ය මණ්ඩලය 'ක්ලීන් ශ්‍රී ලංකා' වැඩසටහනට සහයෝගයක් වශයෙන් ශ්‍රී ලංකා නාවික හමුදාව සමඟ කොළඹ දී වෙරළ පිරිසිදු කිරීමේ වැඩසටහනක් ද පවත්වනු ඇත.

4. මෙම පන්තියේ නෞකාවක් වන INS ඝරියාල් නෞකාව දිට්වා සුළි කුණාටුවෙන් අනතුරුව 2025 දෙසැම්බර් මාසයේදී ටොන් 650ක සහනාධාර රැගෙන ශ්‍රී ලංකාවට පැමිණියේය. ඉන් අනතුරුව ද නෞකාව විසින් 2026 පෙබරවාරි මාසයේදී දිට්වා සුළි කුණාටුවෙන් විනාශ වූ පාලම් ප්‍රතිෂ්ඨාපනය කිරීම සඳහා බේලි පාලම් 10ක් රැගෙන එන ලදී.

5. ඉන්දීය නාවික හමුදා නෞකාවන් ශ්‍රී ලංකා සංචාරයන්හි නිරත වීමේ අරමුණ වන්නේ ඉන්දියාවේ 'අසල්වැසියා ප්‍රථමයෙන්' යන ප්‍රතිපත්තිය සහ ගරු අග්‍රාමාත්‍යතුමාගේ මහාසාගර් (MAHASAGAR) දැක්ම හා අනුකූලව දෙරට මිත්‍රශීලී නාවික හමුදාවන් අතර සබඳතා වඩාත් ශක්තිමත් කිරීමයි.

****

**කොළඹ**
***2026* මැයි *29***